කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011
2013 මැයි - අගෝස්තු

මානවශාස්ත්‍ර පීඨය

ක්‍රිස්තියානි සංස්කෘතිය - CHCU. E1015

ක්‍රිස්තියානි සංස්කෘතිය හැඳින්වීම

කැමති ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි | කාලය : පැය 03 යි

---

01. පුරාණ ඊශ්‍රායෙලයේ නික්මයාමේ සිට රාජ්‍ය තන්ත්‍රයේ ආරම්භය දක්වා (සාවුල් රජුගේ පාලන සමයත් ඇතුලුව) ප්‍රධාන සිදුවීම් පිළිබඳ වාර්තා විග්‍රහ කරන්න.

02. පැරණි ගිවිසුම සමයේ ඊශ්‍රායෙලයේ විවාහය පිළිබඳ සංස්කෘතික සහ මතවාදී පදනම් විග්‍රහ කරන්න.

03. පුරාණ ඊශ්‍රායෙලයේ මංගල්ල තුනක් පිළිබඳ රචනයක් ලියන්න.

04. ජේසු සමිඳුන් විසූ සමයේ පලස්තීනයේ සමාජ තත්ත්වය විග්‍රහ කරන්න.

05. බයිබලය හැදෑරීම පිණිස යොදාගන්නා නූතන ක්‍රමවේද සාකච්ඡා කරන්න.

06. ජේසු සමිඳුන්ගේ දේව රාජ්‍යය පිළිබඳ ඉගැන්වීම් ක්‍රි. ව. පළමුවන සියවසෙහි ජීවත් වූ ජනතාවට අදාල වූයේ කෙසේදැයි විමසන්න.

07. නව ගිවිසුමෙහි ශුභාරංචිවල සඳහන් දුක්විඳීමේ කථා (Passion Narratives) පිළිබඳ ඓතිහාසික විග්‍රහයක් ඉදිරිපත් කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතුරින් කැමති මාතෘකා තුනකට (03) පිළිතුරු සපයන්න.

අ) පලස්තීනයේ බටහිර කඳුවල භූගෝලීය සාධක
ආ) පලස්තීනයේ නැගෙනහිර කඳුවල භූගෝලීය සාධක
ඇ) දාවිත් රජ සමය
ඈ) සලමොන් රජ සමය
ඉ) දේවානුභාවය

****************************